අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/09/12/05/02/01

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2022/12/ 02

චක්‍රලේඛ අංක: 37/2022

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම පාසල්වල විදුහල්පතිවරුන්,

**අ.පො.ස. (උසස් පෙළ) විෂය ධාරා හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ජනාධිපති අරමුදල යටතේ වන ශිෂ්‍යත්ව වැඩසටහන**

අ.පො.ස. (උසස් පෙළ) විෂය ධාරා හදාරණ අඩුආදායම්ලාභී පවුල්වල ඉගෙනීමෙහි දක්ෂතා සහිත සිසු සිසුවියන් සඳහා ජනාධිපති අරමුදල මගින් ශිෂ්‍යත්ව ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට නියමිතය.

මෙම වැඩසටහන සියලුම අධ්‍යාපන කලාපවල ක්‍රියාත්මක අතර මේ යටතේ එක් කලාපයකට වෙන්වන ශිෂ්‍යත්ව ගණන 30 ක් වේ. මේ සඳහා සුදුසුකම් ලබන ශිෂ්‍යත්වලාභීන්ට අ.පො.ස. (උසස් පෙළ) පන්තියට ඇතුළත්ව එම විභාගයට පෙනී සිටින තෙක් මසකට රු. 5,000/- බැගින් මාස 24 ක උපරිම කාල සීමාවක් සඳහා එම ශිෂ්‍යත්ව මුදල ලබාදෙනු ලැබේ.

**01. ශිෂ්‍යත්ව සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය මූලික සුදුසුකම්**

1.1 2021 (2022) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිට, පළමුවර ප්‍රතිඵල අනුව අ.පො.ස. (උසස් පෙළ) විෂය ධාරාව හැදෑරීමට සුදුසුකම් ලබා තිබීම.

1.2 රජයේ පාසලක හෝ රජයේ අනුමත පෞද්ගලික පාසලක හෝ ඉගෙනුම ලබන ශිෂ්‍යයකු/ ශිෂ්‍යාවක වීම.

1.3 දෙමාපිය මාසික අදායම රු.75,000/- නොඉක්මවන පවුලකට අයත් වීම.

**02. අයදුම්පත් ඉදිරිපත් කිරීම**

2.1 පාසල්වල විදුහල්පතිවරුන් විසින් මෙම ශිෂ්‍යත්ව වැඩසටහන පිළිබඳව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත් සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැනුවත් කල යුතුය.

2.2 මෙම ශිෂ්‍යත්වය ඉල්ලුම් කිරීමේ අයදුම්පත්‍රය (ඇමුණුම 01) හා ඊට අදාළ උපදෙස් පාසලේ දැන්වීම් පුවරුවෙහි/ වෙබ් අඩවියෙහි පළකිරීමට විදුහල්පතිවරුන් විසින් වගබලා ගත යුතුය.

2.3 ඉහත මූලික සුදුසුකම් සපුරා ඇති හා <u>ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට කැමති ශිෂ්‍ය ශිෂ්‍යාවන්</u> අදාළ අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතිය (ඇමුණුම 01) අනුව සකස් කර ගත් <u>අයදුම්පත් සමඟ අදාළ සහතිකවල පිටපත් තමා අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටි පාසලේ විදුහල්පතිවරුන් වෙත පමණක් නියමිත දිනයට පෙර භාරදීමට කටයුතු කළ යුතුය.</u> ඉල්ලුම්කරුගේ පවුලේ මාසික ආදායම පිළිබඳව ග්‍රාම නිලධාරි සහතික කරන ලද ප්‍රාදේශීය ලේකම්ගේ වාර්තාව ද සම්පූර්ණ කර ඒ සමඟ යොමු කළ යුතුය.

2.4 නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ අයදුම්පතෙහි සඳහන් සුදුසුකම් සනාථ කිරීමට අවශ්‍ය සහතිකවල පිටපත් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

## 03. තෝරා ගැනීමේ ක්‍රමවේදය

### 3.1 පාසල් මට්ටම

3.1.1 පාසලට ලැබෙන අයදුම්පත් පරීක්ෂා කර, මෙම චක්‍රලේඛයේ 04 හි දැක්වෙන නිර්ණායක හා ලකුණු පටිපාටිය පදනම්ව පාසල් තේරීම් කමිටුවක් මඟින් අයදුම්පත්වල ලකුණු සටහන් කළ යුතුය. පාසල් තේරීම් කමිටුව සඳහා විදුහල්පති හෝ නම් කරනු ලබන නියෝජ්‍ය/ සහකාර විදුහල්පතිගේ සහභාගීත්වයෙන් යුත් ජ්‍යෙෂ්ඨ ගුරුවරු දෙදෙනෙකු පත් කර ගත හැකි අතර අයදුම්පත් සංඛ්‍යාව අනුව තේරීම් කමිටු එකකට වඩා පත් කර ගත හැකිය.

3.1.2 ලකුණු ප්‍රමුඛතාව අනුව ශිෂ්‍ය නාම ලේඛනය සකස් කිරීම අවශ්‍ය වන අතර ඒ සමඟ අයදුම්පත්‍ර හා සහතික කරන ලද සහතික පත්‍රවල ඡායාපිටපත් එම ශිෂ්‍ය ශිෂ්‍යාවන් අ.පො.ස. (උසස් පෙළ) විෂය ධාරාව හදාරණ විදුහල අයත් වන අධ්‍යාපන කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත යොමු කළ යුතුය.

### 3.2 කලාප මට්ටම

3.2.1 කලාප මට්ටමේදී මෙම ශිෂ්‍යත්ව වැඩසටහන සම්බන්ධීකරණය සඳහා මාණ්ඩලික නිලධාරියෙකු පත්කිරීමට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කටයුතු කළ යුතුය. පාසල්වලින් ලැබී ඇති අයදුම්පත් අනුව කලාපයට නියමිත ශිෂ්‍යත්ව සංඛ්‍යාව 30 ක් වන සේ තේරීම් කමිටු මඟින් ශිෂ්‍යත්වලාභීන් තෝරා ගැනීම සිදු කළ යුතුය.

3.2.2. ඒ සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අධීක්ෂණය යටතේ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියෙකුගේ සහභාගිත්වය යටතේ තවත් මාණ්ඩලික නිලධාරියෙකු හා ප්‍රාදේශීය ලේකම් විසින් නම් කරනු ලබන නිලධාරියෙකු සහිතව තිදෙනෙකුගෙන් යුත් කලාප මට්ටමේ තේරීම් කමිටුවක් පත්කර ගත යුතුය.

3.2.3 ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව සැළකිය යුතු සංඛ්‍යාවක් ඉක්මවා ඇති අවස්ථාවක දී තේරීම් කමිටු එකකට වඩා පිහිටුවා ගත හැකිය. තේරීම් කමිටු මඟින් ශිෂ්‍යත්වලාභීන් තෝරා ගැනීමට අදාළ ව මෙම චක්‍රලේඛයේ 04 හි දැක්වෙන නිර්ණායකයන් හා ලකුණු ක්‍රමය පදනම් කර ගත යුතු වේ.

3.2.4 ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමට නිර්දේශ කරනු ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ තොරතුරු, ලබාගත් ලකුණු අනුපිළිවෙල මත ආකෘති අංක 02 හි දක්වා ඇති පරිදි ශිෂ්‍ය නාම ලේඛන සකස් කළ යුතුය. එයට අමතරව තෝරාගත් ශිෂ්‍යත්වධාරීන්ගේ ගිණුම් විස්තර සහිතව මෙහි ආකෘති 03 ද සකස් කළ යුතු අතර අනෙකුත් අයදුම්කරුවන්ගේ ද වෙනම ලැයිස්තුවක් (ලබාගත් ලකුණු ප්‍රමාණය ද ඇතුළත් කර) සනස් කළ යුතුවේ. එම ලේඛන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කර මෘදු හා දෘඩ පිටපත් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතුය. කලාප සම්බන්ධීකරණ නිලධාරීන් විසින් තෝරා ගත් අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍ර හා සහතිකපත්‍රවල පිටපත් ගොනුගත කර තබා ගත යුතුය.

**3.3 පළාත් මට්ටම**

3.3.1 පළාත් මට්ටමේදී මෙම ශිෂ්‍යත්ව වැඩසටහන සම්බන්ධිකරණය සඳහා මාණ්ඩලික නිලධාරියෙකු පත්කිරීමට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කටයුතු කළ යුතුය.

3.3.2 කලාප මට්ටමින් යොමු කරන ලේඛනවලට අනුව එක් කලාපයකට ශිෂ්‍යත්ව 30 ක් වන සේ පළාත් මට්ටමේ සමස්ථ ලේඛනය සකස් කළ යුතු අතර කලාපයකට නියමිත උපරිම ශිෂ්‍යත්ව ගණන නොඉක්මවීමට කටයුතු කළ යුතුය.

3.3.3 පළාත් මට්ටමේ තෝරාගත් ශිෂ්‍ය නාම ලේඛන (ආකෘතිය 02) හා ගිණුම් විස්තර (ආකෘතිය 03) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නිර්දේශ කර, අධ්‍යාපන අමාත්‍යාංශයේ, අධ්‍යාපන අධ්‍යක්ෂ (පාසල් කටයුතු) වෙත යොමු කළ යුතුවේ. එහි මෘදු පිටපත directorschoolactivities@yahoo.com විද්‍යුත් ලිපිනයට නියමිත දිනට පෙර යොමු කළ යුතුය. එමෙන්ම එහි මෘදු පිටපත් pfschol@presidentsoffice.lk යන විද්‍යුත් ලිපිනය වෙත එවීමට කටයුතු කළ යුතුය.

**3.4 ජාතික මට්ටම**

3.4.1 සෑම වර්ෂයකදී ම අයදුම්පත් කැඳවීමට අදාළ උපදෙස් ලිපිය අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

3.4.2 පළාත් මට්ටමින් තෝරා අධ්‍යාපන අමාත්‍යාංශයට යොමු කරනු ලබන යෝජිත ශිෂ්‍යත්වලාභීන් සඳහා මෙම ශිෂ්‍යත්ව ගෙවීම් කරනු ලැබේ.

**04. නිර්ණායක හා ලකුණු පටිපාටිය**

අයදුම්කරුවෙකුට ලබාදිය හැකි උපරිම ලකුණු සංඛ්‍යාව 100 කි.

**4.1 <u>පවුල සම්බන්ධ තොරතුරු</u>**

4.1.1 පවුලේ වයස 21 ට අඩු දරුවන් සංඛ්‍යාව දෙදෙනෙකු හෝ ඊට වැඩිනම් - ලකුණු 04
4.1.2 දෙමව්පියන් දෙදෙනාම අහිමිවීම - ලකුණු 06
4.1.3 දෙමව්පියන්ගෙන් එක් අයෙක් අහිමිවීම - ලකුණු 03
4.1.4 දෙමව්පියන් නොමැති භාරකරුවෙකු ළඟ සිටිනම් - ලකුණු 02
4.1.5 ශිෂ්‍යාගේ/ශිෂ්‍යාවගේ පූර්ණ ශාරීරික දුබලතාවයකදී - ලකුණු 10
(අර්ධ දුබලතාවයක් නම් ලකුණු 05ක් පමණක් ලබා දෙන්න)

(උපරිම ලකුණු 25)

සැ.යු. :- දරුවන් ලෙස සළකනු ලබන්නේ දෙමාපියන් ගෙන් යැපෙන අවුරුදු 21 ට අඩු අවිවාහක දරුවන්ය. ශාරීරික දුබලතාවයන් පිළිබඳව රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

## 4.2 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ ප්‍රතිඵල

4.2.1 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ අනිවාර්ය විෂයන් සඳහා

| | | | |
|---|---|---|---|
| විශිෂ්ට සාමාර්ථයක් සඳහා | (A) | - | ලකුණු 08 |
| අධි සම්මාන සාමාර්ථයක් සඳහා | (B) | - | ලකුණු 06 |
| සම්මාන සාමාර්ථයක් සඳහා | (C) | - | ලකුණු 04 |
| සාමාන්‍ය සාමාර්ථයක් සඳහා | (S) | - | ලකුණු 02 |

4.2.2 2006.03.07 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 2006/09 හි සඳහන් වන සමත් වු කාණ්ඩ විෂයන් සඳහා එක් විෂයකට ලකුණු 01 බැගින් විෂයන් 02 ක උපරිමයකට යටත්ව ලකුණු දෙකක් ලබාදිය යුතුය.

(උපරිම ලකුණු 50)

## 4.3 ක්‍රීඩා

වොලිබෝල්/ දැල්පන්දු/ පාපන්දු/ පැසිපන්දු/ ක්‍රිකට්/ එල්ලේ/ බැඩ්මින්ටන්/ කබඩි/ රගර්/ හොකි/ මලල ක්‍රීඩා/ චෙස්/ කැරම්/ ටෙනිස්/ පිහිනුම්/ ජිම්නාස්ටික්/ කරාටේ/ මේස පන්දු ආදි

| | | ජාතික මට්ටම | පළාත් මට්ටම | කලාප මට්ටම |
|---|---|---|---|---|
| ▪ ක්‍රීඩා ඉසව්වලදී පළමුවන ස්ථානය | - | 09 | 07 | 05 |
| ▪ ක්‍රීඩා ඉසව්වලදී දෙවන ස්ථානය | - | 08 | 05 | 04 |
| ▪ ක්‍රීඩා ඉසව්වලදී තුන්වන ස්ථානය | - | 06 | 03 | 02 |
| ▪ නායකත්වය | - | 01 | 01 | 01 |

(උපරිම ලකුණු 10)

## 4.4 සෞන්දර්ය හෝ අනෙකුත් විෂය සමගාමී ක්‍රියාකාරකම්

- ශිෂ්‍යභට
  බාල දක්ෂ/ බාල දක්ෂිකා
  ප්‍රථමාධාර/ පරිසර නියමු/ වෙනත්

- ජාතික භාෂා හා සාහිත්‍ය තරඟ
  විවාද/ කථික/ නිවේදන/ දැනුම මිනුම
  චිත්‍ර/ නැටුම්/ වාදනය/ ගායනය/ වේදිකා නාට්‍ය
  විෂය ප්‍රවනතා ජයග්‍රහණ

| | | ජාතික මට්ටම | පළාත් මට්ටම | කලාප මට්ටම |
|---|---|---|---|---|
| ▪ පළමුවන ස්ථානය | - | 09 | 07 | 05 |
| ▪ දෙවන ස්ථානය | - | 08 | 05 | 04 |
| ▪ තුන්වන ස්ථානය | - | 06 | 03 | 02 |
| ▪ නායකත්වය | - | 01 | 01 | 01 |

(උපරිම ලකුණු 10)

**4.5 ශිෂ්‍ය නායකත්වය**

- පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායක - 05
- පාසලේ උප ප්‍රධාන ශිෂ්‍ය නායක - 04
- ශිෂ්‍ය නායක (ජ්‍යෙෂ්ඨ/ කණිෂ්ඨ) - 03
- ශ්‍රේණි නායක - 02
- පන්ති නායක - 01

(උපරිම ලකුණු 05)

සැ.යු. :-

- ඉහත 4.3 සහ 4.4 හිදි, එක් ශිෂ්‍යයෙකුට/ ශිෂ්‍යාවකට එකම විෂය සමගාමී කටයුත්තක් සඳහා ජාතික, පළාත්, හා කලාප යන මට්ටම් සියල්ලටම ලකුණු ලබා නොදිය යුතුය. ලකුණු ලබාදීමේදී සැළකිල්ලට ගත යුත්තේ ඉහළම ලකුණු මට්ටම් පමණි.

- ඉහත 4.5 හිදි ලකුණු දීමේ දී සැළකිල්ලට ගත යුත්තේ ඉහළම ලකුණු මට්ටම පමණි.

**05. ශිෂ්‍යත්ව ප්‍රදානය**

5.1 ද්විතියික අධ්‍යාපන අදාළ වර්ෂයේ 12 වන ශ්‍රේණියට ඇතුළත් ව අ.පො.ස. (උසස් පෙළ) අධ්‍යාපනය ආරම්භ කරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතරින් තෝරා ගත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් අ.පො.ස. (උසස් පෙළ) ඉගෙනුම ලබන අවුරුදු 2 ක කාල සීමාව තුළ එක් මසකට රු.5000/= බැගින් ශිෂ්‍යත්ව වාරික 24 ක් ලබා දෙනු ලැබේ. අදාළ මුදල ශිෂ්‍යත්වලාභියාගේ නමට විවෘත කරනු ලබන බැංකු ගිණුමකට සෘජුව ම ප්‍රේරණය කරනු ලැබේ.

4.6 අදාළ ශිෂ්‍යත්වලාභියා යම් හේතුවක් නිසා ඉගෙනුම ලබන පාසලෙන් ඉවත්ව වෙනත් පාසලකට ඇතුළත්ව ඇත්නම්, ඒ බව තහවුරු කරන ලිපියක් විදුහල්පති විසින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂට හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට පිටපතක් සහිතව අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාව වෙත යොමු කළ යුතුය.

**06. ශිෂ්‍යත්ව නියාමනය**

**6.1**කලාප මට්ටමින් ශිෂ්‍යත්ව නියාමනය කිරීම ඔවුන් ඉගෙනුම ලබන පාසල අයත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සිදු කළ යුතුය. ඒ සඳහා සම්බන්ධීකරණ නිලධාරියාට අදාළ වගකීම පැවරිය යුතුය.

6.2 පළාත් මට්ටමින් ශිෂ්‍යත්වලාභීන් නියාමනය කිරීම අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සිදුකළ යුතු අතර ඒ සම්බන්ධ වගකීම සම්බන්ධීකරණ නිලධාරියාට පැවරිය යුතුය.

6.3ජාතික මට්ටමින් ශිෂ්‍යත්වලාභීන් නියාමනය කිරීම අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාව මඟින් සිදු කරනු ඇත.

**07.** ශිෂ්‍යත්වය අවලංගු විය හැකි අවස්ථා

7.1 පහත සඳහන් අවස්ථා හා හේතු පිලිබඳ සලකා බලා චක්‍රලේඛ අනුව මෙම ශිෂ්‍යත්වලාභීන්ට ලබාදෙන ශිෂ්‍යත්ව අවලංගු කිරීමේ බලය අධ්‍යාපන ලේකම් සතු වේ.

I. ශිෂ්‍යත්වලාභියා විනය විරෝධි හැසිරීම සඳහා දඬුවම් ලැබීම.
II. අඛණ්ඩව පාසලට නොපැමිනීම
III. අඛණ්ඩව අධ්‍යාපන කටයුතුවලින් බැහැර වීම.
IV. අ.පො.ස. (උසස් පෙළ) අධ්‍යාපනය සම්පූර්ණ නොකර පාසලෙන් ඉවත් වීම.

**08.** කාල රාමුව

| කාර්යය | | කාලය |
|---|---|---|
| 8.1 අයදුම්පත් කැඳවීම. | - | අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ප්‍රතිඵ නිකුත් කර මාසයක් ඇතුළත<br>මෙම වර්ෂය සඳහා 2022/12/23 |
| 8.2 විදුහල්පති විසින් කලාප අධ්‍යාපන කාර්යාලයට අයදුම්පත් යැවීම. | - | අයදුම්පත් කැඳවා සති 02 ක් ඇතුළත<br>මෙම වර්ෂය සඳහා 2023/01/07 |
| 8.3 කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අදාළ ලේඛන පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට යැවීම. | - | පාසල්වලින් අයදුම්පත්‍ර ලැබී සති 03 ක් ඇතුළත<br>මෙම වර්ෂය සඳහා 2023/01/27 |
| 8.4 පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අදාළ ලේඛන අධ්‍යාපන අමාත්‍යාංශයට යැවීම. | - | කලාප මට්ටමේ ලැයිස්තු ලැබී සතියක් ඇතුළත<br>මෙම වර්ෂය සඳහා 2023/02/03 |
| 8.5 අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ජනාධිපති ලේකම් කාර්යාලයට යැවීම. | - | පළාත් මට්ටමේ ලැයිස්තු ලැබී සතියක් ඉක්මයාමට පෙර<br>මෙම වර්ෂය සඳහා 2023/02/10 |

මෙම චක්‍රලේඛයෙන් පැන නගින කිසියම් ගැටලුවක් ඇත්නම් ඒ සම්බන්ධයෙන් අධ්‍යාපන ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

එම්.එන්. රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

**ආදර්ශ අයදුම්පත්‍රය**　　　　　කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා -:

**2021 (2022) වර්ෂයේදී පවත්වන ලද අ.පො.ස.(සා.පෙළ) විභාගයට පළමුවරට පෙනී සිට විභාගය සමත්ව 2024 වර්ෂයේදී අ.පො.ස.(උ.පෙළ) හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ජනාධිපති අරමුදල මගින් පිරිනමන ශිෂ්‍යත්ව**

(අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර උපදෙස් පත්‍රිකාව බලන්න.)

සැ.යු. -: අයදුම්කරුවන් අයදුම්පත් සම්පූර්ණ කොට තමා අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට අධ්‍යයන කටයුතුවල යෙදුනු පාසලේ විදුහල්පති වෙත පමණක් ................................ දිනට හෝ ඊට පෙර භාරදිය යුතුය. ලකුණු ඇතුළත් කළයුතු කොටු අයදුම්කරු විසින් පිරවිය යුතු නොවේ.

පළාත :-.......................................

දිස්ත්‍රික්කය :-..................................

අධ්‍යාපන කලාපය :-.........................

**I කොටස**

01. අයදුම්කරුගේ පෞද්ගලික තොරතුරු

| | |
|---|---|
| මුලකුරු සමග නම | :-.......................................... |
| මුලකුරුවලින් හැඳින්වෙන නම | :-.......................................... |
| අ.පො.ස.(සා.පෙළ) විභාගයට පෙනී සිටි | |
| • මාධ්‍යය | :-.......................................... |
| • විභාග අංකය | :-.......................................... |
| පෙනී සිටි පළමු අවස්ථාවේදීම අ.පො.ස.(සා.පෙළ) විභාගය සමත්ව උසස් පෙළ හැදෑරීමට සුදුසුකම් ලැබුවේද යන බව | :-.......................................... |
| අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා අධ්‍යාපනය ලද පාසල | :-.......................................... |
| අ.පො.ස.(උ.පෙළ) හදාරන පාසල | :-.......................................... |
| උපන් දිනය | :-.......................................... |
| පෞද්ගලික ලිපිනය | :-.......................................................... |
| | .......................................................... |
| දුරකථන අංකය (ස්ථාවර) | :-.......................................... |
| (ජංගම) | :-.......................................... |
| ඔබ 5 වැනි ශ්‍රේණියේ ශිෂ්‍යාධාරලාභියෙක්ද? | :-.......................................... |

---

**II කොටස**

**01. පවුල සම්බන්ධ තොරතුරු**

| | කාරණය | | ලකුණු |
|---|---|---|---|
| 01.01 | මාපියන්ගෙන් යැපෙන වයස අවුරුදු 21ට අඩු පවුලේ සහෝදර සහෝදරියන් සංඛ්‍යාව | (.............) | |
| 01.02 | • ඔබගේ මව්පිය දෙදෙනාම ජීවත්ව සිටිත්ද? | ඔව්/නැත | |
| | • දෙමව්පියන් නොවන භාරකරුවකු යටතේ සිටින්නේද? (එසේ නම් නීත්‍යානුකූල භාරකාරත්වය සනාථ වන ලේඛනවල පිටපත් ඇමිණිය යුතුය.) | ඔව්/නැත | |
| 01.03 | ඔබගේ මව හෝ පියා පමණක් ජීවත්ව සිටින්නේද? | ........................ පමණක් සිටියි | |
| 01.04 | ඔබ ශාරීරික දුබලතාවයකින් පෙළෙන්නේද? පෙළෙන්නේ නම් එම දුබලතාව කුමක් ද? ............................................................................................ | ඔව්/නැත | |
| | | ලබාගෙන ඇති ලකුණු එකතුව (උපරිමය ලකුණු 25කි.) | |

**02.** <u>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ ප්‍රතිඵල</u>

| | විෂයය | | ශ්‍රේණිය | ලකුණු |
|---|---|---|---|---|
| 02.01 | ආගම | :- | ................ | |
| 02.02 | භාෂාව හා සාහිත්‍යය | :- | ................ | |
| 02.03 | ඉංග්‍රීසි භාෂාව | :- | ................ | |
| 02.04 | ගණිතය | :- | ................ | |
| 02.05 | ඉතිහාසය | :- | ................ | |
| 02.06 | විද්‍යාව | :- | ................ | |
| 02.07 | පළමු විෂය කාණ්ඩයට අයත් විෂයය (විෂයය...............................................) | :- | ................ | |
| 02.08 | දෙවන විෂය කාණ්ඩයට අයත් විෂයය (විෂයය...............................................) | :- | ................ | |
| 02.09 | තෙවන විෂය කාණ්ඩයට අයත් විෂයය (විෂයය...............................................) | :- | ................ | |
| | ලබාගෙන ඇති ලකුණු එකතුව | | | |

**03.** <u>ක්‍රීඩා</u>

උදා:- (උදාහරණ:අත්පන්දු / දැල්පන්දු / පාපන්දු / පැසිපන්දු /ක්‍රිකට් / එල්ලේ / බැඩ්මින්ටන්/ කබඩි/ රග්බි/ හොකී/ මලල ක්‍රීඩා/ චෙස්/ කැරම්/ටෙනිස්/ පිහිනුම්/ ජිම්නාස්ටික්/ කරාටේ/ මේස පන්දු ආදි)

| ක්‍රීඩාව | ජාතික මට්ටමින් | | පළාත් මට්ටමින් | | කලාප මට්ටමින් | |
|---|---|---|---|---|---|---|
| | නායකත්වය/සහභාගිත්වය | | නායකත්වය/සහභාගිත්වය | | නායකත්වය/සහභාගිත්වය | |
| | 1 වන ස්ථානය | 2 හෝ 3 වන ස්ථානය | 1 වන ස්ථානය | 2 හෝ 3 වන ස්ථානය | 1 වන ස්ථානය | 2 හෝ 3 වන ස්ථානය |
| 1. | | | | | | |
| 2. | | | | | | |
| 3. | | | | | | |
| 4. | | | | | | |
| | | | | | ලබාගෙන ඇති ලකුණු එකතුව (උපරිම ලකුණු ප්‍රමාණය 10 කි.) | |

## 04. සෞන්දර්ය හෝ විෂය සමගාමී ක්‍රියාකාරකම්

(උදාහරණ-විවාද/කථික/දැනුම/මිනුම/වාදනය/ගායනය/චිත්‍ර/නැටුම්/බාලදක්ෂ/ශිෂ්‍යභට/ප්‍රථමාධාර/පරිසර නියමු/වෙනත්/ විෂය ප්‍රවීනතා ජයග්‍රහණ හෝ වෙනත්)

| ක්‍රියාකාරකම් | ජාතික මට්ටමින් | | පළාත් මට්ටමින් | | කලාප මට්ටමින් | |
|---|---|---|---|---|---|---|
| | නායකත්වය/සහභාගිත්වය | | නායකත්වය/සහභාගිත්වය | | නායකත්වය/සහභාගිත්වය | |
| | 1 වන ස්ථානය | 2 හෝ 3 වන ස්ථානය | 1 වන ස්ථානය | 2 හෝ 3 වන ස්ථානය | 1 වන ස්ථානය | 2 හෝ 3 වන ස්ථානය |
| 1. | | | | | | |
| 2. | | | | | | |
| 3. | | | | | | |
| 4. | | | | | | |
| | | | | | ලබාගෙන ඇති ලකුණු එකතුව (උපරිම ලකුණු ප්‍රමාණය 10 කි.) | |

## 05. ශිෂ්‍ය නායකත්වය

| | | ලකුණු |
|---|---|---|
| 01 | පාසල් ප්‍රධාන ශිෂ්‍ය නායක | |
| 02 | පාසල් උප ප්‍රධාන ශිෂ්‍ය නායක | |
| 03 | ශිෂ්‍ය නායක (කණිෂ්ඨ/ජ්‍යෙෂ්ඨ) | |
| 04 | ශ්‍රේණි නායක | |
| 05 | පන්ති නායක | |
| | ලබාගෙන ඇති ලකුණු එකතුව (උපරිම ලකුණු ප්‍රමාණය 05 කි) | |

## 06. ලකුණු සාරාංශය

| | | |
|---|---|---|
| 01 | පවුල සම්බන්ධ තොරතුරු | |
| 02 | අ.පො.ස.(සා.පෙළ) විභාගය | |
| 03 | විෂය සමගාමී - (ක්‍රීඩා) | |
| 04 | විෂය සමගාමී - (සෞන්දර්ය හා වෙනත්) | |
| 05 | ශිෂ්‍ය නායකත්වය | |
| | **ලබාගෙන ඇති මුළු ලකුණු ප්‍රමාණය** | |

ඉහත දැක්වෙන කරුණු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. අවශ්‍ය අවස්ථාවකදී අදාළ සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට මම එකඟ වෙමි.

.........................

දිනය : 20............................ දි

අයදුම්කරුගේ අත්සන

**<u>විදුහල්පතිගේ සහතිකය</u> :-**

ඉහත 1-5 දක්වා සඳහන් කර ඇති ලකුණු ලබාදීම නිවැරදි බවත්, අනෙකුත් පෞද්ගලික තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සහතික කරමි.

දිනය : ..................

..................................
විදුහල්පතිගේ අත්සන හා
නිල මුද්‍රාව

---

**<u>පවුලේ මාසික ආදායම පිළිබඳ ප්‍රකාශය</u> :-**

(මව/පියා/භාරකරු විසින් සම්පූර්ණ කළයුතුය)
මම ................................................................................ රැකියාව කරමි./ රැකියාවක් නොකරමි. මගේ ස්වාමිපුරුෂයා / භාර්යාව.......................................................................... ආයතනයේ රැකියාව කරනු ලබයි./ රැකියාවක් කරනු නොලබයි. අප පවුලේ මාසික ආදායම රු: .................................. බව ද ප්‍රකාශ කරමි.

............................................
මව/පියා/භාරකරුගේ අත්සන
නම : .....................................

දිනය: .....................

ඉහත සඳහන් ආදායම පිළිබඳ කරුණු නිවැරදි බව සහතික කරමි.

...................................
ග්‍රාම නිලධාරිගේ අත්සන හා
නිල මුද්‍රාව

දිනය: ......................

ඉහත ආදායම පිළිබඳ කරුණු නිවැරදි බව සහතික කරමි.

...............................................
ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන හා
නිල මුද්‍රාව

දිනය: .....................

---

**කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,**

................................................................. ශිෂ්‍යයා/ශිෂ්‍යාව විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

....................................
විදුහල්පතිගේ අත්සන හා
නිලමුද්‍රාව

දිනය: ...............................

ආකෘති 02

අ.පො.ස. (උසස් පෙළ) හදාරණ ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ජනාධිපති අරමුදල මගින් පිරිනමන ශිෂ්‍යත්ව සඳහා නිර්දේශිත නාම ලේඛනය

(2021(2022) වර්ෂයේදී පවත්වන ලද අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ ප්‍රතිඵල මත)

**(ශිෂ්‍ය, ශිෂ්‍යාවන් ලබාගත් ලකුණු අනුපිළිවෙල අනුව මෙම ආකෘතිය සම්පූර්ණ කළ යුතුය)**

පළාත :

දිස්ත්‍රික්කය :

අධ්‍යාපන කලාපය :

| අනුක්‍රමික අංකය | ශිෂ්‍යාගේ/ ශිෂ්‍යාවගේ නම | ස්ත්‍රී/ පුරුෂ භාවය | අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට අයදුම් කළ පාසල | අ.පො.ස. (උසස් පෙළ) හදාරණ පාසල | පෞද්ගලික ලිපිනය | ලබාගත් ලකුණු |
|---|---|---|---|---|---|---|
| 01.<br>02.<br>03.<br>04.<br>.<br>.<br>.<br>30 | | | | | | |

තේරීම් කමිටු සාමාජිකයාගේ නම තනතුර රාජකාරි ලිපිනය

01.

02.

03

දිනය :

ඉහත තෝරාගත් ශිෂ්‍ය ලේඛනය නිර්දේශ කරමි.

දිනය :- ..........................................

අත්සන හා නිලමුද්‍රාව :- ..........................................

(පළාත්/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ)

ආකෘතිය 03

List of names recommended for scholarships to be awarded to GCE (A/L) students by the President's Fund
(Based on their performance at the GCE (O/L) Examination held in 2021 (2022))

Province:
District:
Educational Zone:
Tel. No.:

| Serial No. | Name of the student | Name of the school | Mobile Number | NIC No. (if any) | Bank & Branch | Account Number | Bank Code | Branch Code |
|---|---|---|---|---|---|---|---|---|
| 01<br>02<br>03<br>04<br>.<br>.<br>.<br>30 | | | | | | | | |

..........................................

Date :

Signature
Provincial/ Zonal Education Director

The above information should be printed on **MS-Excel Sheet in Block capitals.** A soft copy, (pfschol@perseidentsoffice.lk) should be sent along with its original together with photo copies of the bank Account and National Identity card.

<u>ආකෘතිය 03 පිරවීමේදී පහත සඳහන් උපදෙස් පිළිබඳව සැළකිළිමත් විය යුතුය.</u>

1. ආකෘති පත්‍රය 03 ඉංග්‍රීසි භාෂාවෙන් පුරවා එවිය යුතුය.
2. MS – Excel Sheet එකක් ආකාරයට තොරතුරු ඉදිරිපත් කළ යුතුය.
3. "Times New Roman " ආකාරයට අකුරු ප්‍රමාණය 11 න් ඉහත ආකෘති පත්‍ර 03 සම්පූර්ණ කර එවිය යුතුය.
4. ශිෂ්‍යත්වලාභීන්ගේ නම් සඳහන් කර එවන තීරුව මුලකුරු සහිතව සඳහන් කළ යුතු අතර මුලකුරු අතර තිතක් නොතබා එක් හිස්තැනක් (Space 1 ක්) පමණක් තැබිය යුතුය.
   උදා A B C Senanayake
5. සියළුම ශිෂ්‍යාධාරලාභීන් සඳහා ශිෂ්‍යත්ව මුදල් ලංකා බැංකුවේ නව ගිණුමක් ආරම්භ කර ඒ වෙත බැර කිරීමට කටයුතු සුදානම් කර ඇති බැවින් ලංකා බැංකුවේ ආරම්භ කරන ලද නව ගිණුම් අංකයම සඳහන් කර එවිය යුතුය.